## ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

## අනුරාධපුර දිස්ත්‍රික්කය

-------------------------------------

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 20 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව සභාව වෙත ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.512,587 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල එම අගය රු.761,897 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.249,310 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂ වලට අදාලව සභාව වෙත අය විය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී ජල ව්‍යාපෘතියක් සඳහා මිළදීගෙන තිබුණු රු.3,452,403 ක් වටිනා ජලනල තොගය අතැති තොග ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

**(ඈ)** බැංකු ජංගම ගිණුමක සභාව සතුව තිබුණු රු.2,000,966 ක මුදල් ශේෂය ගිණුම්වලින් අත්හැරී තිබුණි.

**(ඉ)** සමාලෝචිත වර්ෂය අවසන් වනවිට සභාවට අයවිය යුතුව පවතින උසාවි දඩ මුදල් ශේෂය රු.511,776 ක් වුවත් එම ශේෂය ගිණුම්වල අනාවරණය කර නොතිබුණු අතර 2012 වර්ෂයේ අවසානයේදී අයවිය යුතුව පැවති රු.777,119 ක් අවිධිමත් ලෙස ලේඛන වලින් ඉවත් කර ඇති බවද නිරීක්ෂණය විණි.

**(ඊ)** සමාලෝචිත වර්ෂයට අදාලව සතිපොල බදුදීම වෙනුවෙන් තැන්පත් කර තිබුණු රු.856,633 ක ගිවිසුම් ඇප මුදල ආදායමට ගැලපීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණු අතර ආදායම් වෙනුවෙන් තැන්පත් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**(උ)** සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟහිටි වෙළඳසැල් හා කඩකුලී ශේෂය රු.623,690 ක් වියයුතු වුවද එම ශේෂය රු.961,762 ක් ලෙස දැක්වීම හේතුවෙන් එම ශේෂය රු.338,072 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**(ඌ)** සමාලෝචිත වර්ෂය අවසානයේ පළාත් නැගුම සංවර්ධන වැඩසටහන යටතේ සභාව වෙත ලැබියයුතු මුදල රු.2,654,720 ක් වුවත් එම අගය රු.9,125,297 ක් ලෙස දක්වා ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයගැති ශේෂය රු.6,470,577 කින් වැඩියෙන් දක්වා තිබුණි

**(එ)** වටිනාකම් එකතුව රු.6,680,966 ක්වූ ගිණුම් විෂයයන් 09 ක් ඉකුත් වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් තිබුණු අතර එම ගිණුම් ශේෂ නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි.

**1.3.2 නොසැසඳු ගිණුම්**

--------------------

මුල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 05 ක ශේෂයන් හා ඉදිරිපත් කළ උපලේඛන වල දක්වා තිබුණු ශේෂයන් අතර රු.7,180,132 ක වෙනසක් පැවතුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

-------------------------------------

එකතුව රු.39,994,644 ක් වු වත්කම් හා වගකීම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් ඌණතාවය රු.2,923,387 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ඌණතාවය රු.196,581 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 වරිපනම් බදු

-----------------

සභාවේ වාර්ෂික ඇස්තමේන්තුගත වරිපනම් බදු ආදායම රු.860,679 ක් වන අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වසර 04 ක කාලයක සිට පවතින හිඟහිටි ශේෂය රු.3,348,456 ක් විය.

#### 2.2.2 උසාවි දඩ

-----------

සභාව විසින් නඩත්තු කරනු ලබන උසාවි දඩ ලේඛනයට අනුව 2012 වර්ෂය අවසානයට අයවිය යුතු ලෙස දක්වා තිබුණු උසාවි දඩ රු.1,658,754 කින් 2013 වර්ෂයේදී රු.777,119 ක් ලේඛන වලින් ඉවත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.511,776 ක් වූ හිඟ ශේෂයද ලේඛන වලට ගෙන නොතිබුණි. ඒ අනුව රු.1,288,895 ක හිඟහිටි උසාවි දඩ ශේෂයක් අවිධිමත් ලෙස පොත්වලින් ඉවත්කර තිබුණි.

#### 2.2.3 මුද්දර ගාස්තු

--------------

2013 හා 2014 වර්ෂයට අදාලව සභාව වෙත අයවිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන නොතිබුණු අතර 2011 හා 2012 වර්ෂ වලට අදාලව රු.972,160 ක මුදලක් සභාව වෙත අයවිය යුතු බවට හඳුනාගෙන ඇතත් එම ශේෂය ගිණුම්වල අනාවරණය කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සභාව විසින් ක්‍රියාත්මක කල ජල ව්‍යාපෘතියේ ජල පොම්පාගාරයට ලබාදී තිබුණු විදුලි සම්බන්ධතාවට අදාල විදුලි බිල්පත් සඳහා කාලීනව ගෙවීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මස සිට 2015 ජනවාරි මාසය දක්වා මාස 12 කදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් බිල්පත් වලට එකතුකර තිබුණු පොලී මුදල් එකතුව රු.27,215ක් විය.

(ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 3.2 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සභාව සතු වටිනාකම එකතුව රු.2,750,000 ක් වාහන හා යන්ත්‍රෝපකරණ, වටිනාකම රු.3,452,403 ක් ජලනල තොගයක් හා වටිනාකම හඳුනා නොගත් වයිබ්‍රේට් ප්ලේට් කම්පැක්ටරයක් සමාලෝචිත වර්ෂය පුරා නිශ්ක්‍රීයව පැවතුණි.

## 3.3 අත්හැර දැමූ ව්‍යාපෘති

ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය මහ ලේකම් විසින් වර්ෂ 2009-2012 කාලය තුළ රු.18,128,045 ක් පිරිවැය දරා ක්‍රියාවට නංවා තිබුණු ප්‍රජා ජල ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂයේදී සභාවට පවරාගෙන තිබුණද අදාළ වත්කම් නිසි ලෙස හඳුනාගෙන විධිමත් පරිදි සභාව වෙත පවරාගෙන නොතිබුණි. එමෙන්ම ජල සම්බන්ධතා ලබා දීම සඳහා බල ප්‍රදේශයේ ඉල්ලුම්කරුවන්ගෙන් රු.903,000 ක් අයකරගෙන තිබුණු අතර නිරීක්ෂණය වූ අවස්ථා 07 කදී රු.631,935ක් සභාව විසින් වියදම් දරා තිබුණි. කෙසේ නමුත් ජල ටැංකියේ හා නළ පද්ධතියේ දෝෂ හේතුවෙන් මේ දක්වා ජලය ලබා දීමට නොහැකිවී තිබුණු අතර මේ වන විට මෙම ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

**4. පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමනාකරණය